

# පමා නොවී එමි අකුරට

රසික සූරියආරච්චි ලියයි

තම ප්‍රථම දරුවා වන මගේ පියා මෙලොවට බිහිකරන විට මගේ මිත්තණියගේ වයස අවුරුදු දහ අටක්වත් සම්පූර්ණ වී නොතිබුණි. ඇය විවාහ වන්නට ඇත්තේ වත්මන් පිළිගැනීම අනුව නම් බාල වයස්කාරියක ලෙසිනි.

අවුරුදු දහ අටක් තබා විසි එකකින් වත් විවාහ වීම අද කාලයේ හැටියට නම් අරුමයකි. උසස් පෙලෙන් පසු, වැඩිදුර අධ්‍යාපනයද නිමවා, රැකියා- වක් කිරීම අරඹන්නට ඉඩ ලැබෙන කාලය වනවිට අපි බොහෝ දෙනා අවුරුදු විසිපහට කිට්ටු කර ඇති අය වෙමු. ඒ වයසේ දී වුවද, මුලින්ම විවාහ

## ආදර රෝගය

වූ මිතුරන් කිහිප දෙනාව අප සරදම් බසින් හැඳින්වූයේ පොලිසියෙන් අල්ලා බන්දපු අයවලුන් වශයෙනි.

කාලයත් සමගම විවාහවන වයස පමා වීමට හේතුවන විවිධ සමාජ ආර්ථික සම්බාධක මො- හොතකට අමතක කර මිනිස් සිරුරේ ජීව විද්‍යාත්මක වර්ධනය පිළිබඳ කරුණු සලකා බැළුව හොත් නිසැකවම පෙනී යන්නේ ප්‍රජණන ක්‍රියාවලියට සම්මාදම් වීම සඳහා කාම සම්භෝගයෙහි යෙදෙන්නට, පාරම්පරික භාෂාවෙන් කියනවා නම් හේනක් කොටන්නට, අවශ්‍ය ජීව විද්‍යාත්මක හැකියාව අපට ගැටවර වියේදීම ලැබෙන බවයි.

අපේ ආච්චිලාගේ කාලයෙන් ශත වර්ෂයක් පමණ ගෙවී අප සමාජයක් වශයෙන් දියුණු වී ඇති වත්මනේ දී අවුරුදු දහ අටේ අම්මලා බිහිවන්නේ ඉතා කලාතුරකින් පමණි. එය වාසනාවක් ද, අවාසනාවක්ද නොදනිමි.

නීත්‍යානුකූලව හෝ සම්ප්‍රදායානුකූලව විවාහයෙන් බැඳෙන්නට එසේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ කල්මරන්නට සිදු වූවද, ශරීරයේ හෝමෝන වර්ධන ක්‍රියාවලිය නම් නැවතිය නොහැකිවේ. ගැටවර වියේ දී එද අප කාටත් අමුතු ආකාරයක උණක් හැදුනේද, අද අපේ දරුවන්ට එසේ වන්නේ ද ඒ නිසාමය.

*කොල්ලන්ට වැලඳෙන උණ රෝගයේ මූලික රෝග ලක්ෂණ වනුයේ එදිනෙදා බස්රියේ දී, දුම්රියේ දී නෙත ගැටෙන බාලිකාවන්, ගමේ අවට නිවෙස් හි වසන යුවතියන් පිළිබඳව වෙනද නැති උනන්දුවක් ඇති වීමයි.*

මා ආනන්දයේ ගතකලේ මේ ගැටවර උණ රෝගයේ දරුණුම අවධියයි. මටත් වඩා මේ උණෙන් පෙලුණු කොල්ලෝ ද අපේ පන්තිවල වූහ.

සමහර උණ රෝග, උණෙන් සන්නිපාතයට ද, සන්නිපාතයෙන් මුලු ජීවිත කාලයටම බලපාන, ලප කැළල් ඉතිරි කරණ, රෝගාබාධවලට ද පෙරලේ. යොවුන් වියේ දී අපට වැළඳුණු මේ උණ රෝගයට මූලික හේතුව ශරීරානුගත හෝමෝන වුවද, පසුව එළැඹෙන දරුණු තත්වයන්ට නම් අනිවාර්ය හේතුකාරකය පරිසරයේ පවතින විෂබීජ බවද කිව යුතුය.

කොල්ලන්ට වැලඳෙන උණ රෝගයේ මූලික රෝග ලක්ෂණ වනුයේ එදිනෙද බස්රියේ දී, දුම්රියේ දී නෙත ගැටෙන බාලිකාවන්, ගමේ අවට නිවෙස් හි වසන යුවතියන් පිළිබඳව වෙනද නැති උනන්දුවක් ඇති වීමයි. ඔවුන් දෙස කන්නට මෙන් බලන්නට, ඔවුන් ගැන නිරතුරු සිතන්නට, සිහින මවන්නට පෙළඹීම මේ රෝග ලක්ෂණවල ස්වභාවයයි. සමහරු කවි ලියන්න- ටද පටන් ගනිති.
මේ අතර හිටි හැටියේම හෝ ක්‍රම ක්‍රමයෙන් ඒ කෙල්ලන් අතරින් එක් කෙල්ලෙක් වෙත කොල්ලා ගේ සිත කාන්දමකට ඇදී යන ටින්ටස් ඇණයක් සේ ආකර්ෂණය වීමට නියමිතය.

ආදර රෝගය හෙවත් ලව් සික් සැබෑවටම වැලඳෙන්නේ ඒ මො- හොතේදී ය.

මේ ආදර රෝගය හෙවත් ලව්-සික් වැලඳුණු කොල්ලෙකු මුලින්ම පත්වන්නේ මහා අසහනකාරී තත්වයකටයි. එයට ප්‍රධානතම හේතුව වන්නේ හිතේ පිළිසිඳගත් ඒ ආදර සිතුවිලි ඒවායේ හිමිකාරියට දන්වන්නට නොහැකි වීමයි. ඒ සරල පියවර ගන්නට පවා කොල්ලන් ගේ ඇතිවන්නේ මහා ලජ්ජා බියකි.

මේ බව ප්‍රංශ ජාතික නවකතාකරු වික්ටර් හියුගෝ ලෝ ප්‍රකට ලේ මිසරාබ්ල නමැති කෘතියේ ද දක්වා ඇත. හියුගෝ පවසන්නේ තරුණයෙකුගේ ආදරයේ ප්‍රථම රෝග ලක්ෂණය නම් ලජ්ජාව බවයි.

වැඩි වියට පත්වන කොල්ලන් එලෙස අසනීප වෙද්දී, කෙල්ලන් ද මේ ආකාරයේ පරිවර්තනයකට ලක්වෙතැයි මම සිතමි. ජීව විද්‍යාත්මක හේතු සාධක නිසා බොහෝ විට එය සිදුවන්නේ වයසින් කොල්ලන්ට වඩා කලින් සමයකදීය. පෙරකී ලේ මිසරාබ්ල නවකතාවේ දී වික්ටර් හියුගෝ පවසා ඇත්තේ, ආදරය නිසා තරුණියකට ලැබෙන්නේ එඩිතර කමක් බවයි.

තරුණිය ආදරය නිසා කෙතරම් එඩිතර වී ඇති වුවද, තරුණයා බියට පත් වී ඇත්නම් ඉන් පලක් නොවේ. මක් නිසාද යත් ලෝක සම්ප්‍රදය අනුව පලමු පියවර ගත යුතුවන්නේ පිරිමියා වීමයි.

ඊට අමතරව ලංකාව වැනි සමාජ සංස්ථාවල තරුණියන්ට ඇති තහනම් සම්බාධක නිසා අර පෙර කී එඩිතරකමින් ද වැඩි වැඩක් නොවේ.

මෙහිදී අපේ බියපත් තරුණයාගේ පිහිටට ඉන්නේ ඔහු ගේ මිතුරන් කැළයි. නැතහොත් ගැන්සියයි. මේ ගැන්සියකට කොල්ලෙක් ව ඇති කරන්න බැරි මුත් නැතිකරන්නට නම් හැකිය.

අද මා මේ පමා නොවී එමි අකුරට කොලමේ කෙටියෙන් සඳහන් කරන්නට යන්නේ එවන් යහළුවන් පිරිසක් විසින් කොල්ලෙකුව විනාශ කළ දුක්බර කතාවකි.

ලව් සික් උණ රෝගය ඔහුගේ ශරීරය වෙළාගන්නා දිනය තෙක්ම කුමාර ඉගෙනීමට හොඳ උනන්දුවක් දැක්වූ ශිෂ්‍යයෙකු වූයේය. අප දෙදෙනාම පාසලට ආවේ එකම ප්‍රදේශයේ සිට දුම්රියෙනි. එය, අපට දෙනොටම තිබූ පහසුතම සහ වඩාත් කාර්‍යක්‍ෂතම පාසල් ගමනාගමන ක්‍රමය විය.

හදිසියේම කුමාර පාසල් බස් රථයේ පාසලට ඒමට හා නිවසට යාමට පටන් ගත්තේය. පසුව ඔහු මා හා පැවසූයේ මෙයට හේතුව නම් ඔහු වාසය කළ නගරයේ සිට කොළඹ බලා දිවෙන පාසල් බසයේ ගමන් කළ එක්තරා බාලිකා පාසලක සිසුවියක් බවයි. කුමාරට උණ රෝගය සැදී තිබුණේ මේ සිසුවිය, එනම් සුරේනි අරඹයාය. ඇය ඒ වන විට නමවන ශ්‍රේණියේ සිසුවියකි. කුමාර උසස් පෙළ දෙවන වසරේය.

උණ කෙසේ වෙතත් මගේ සෙම්ප්‍රතිශ්‍යාවන් තිබුනේ දුම්රිය ආශ්‍රිතව නිසා, කුමාර බසයෙන් යද්දී, මම තවදුරටත් දුම්රියෙන් ම පාසල් ගියෙමි.

කුමාර සාමාන්‍යයෙන් ලජ්ජාශීලී අයෙකු විය. ඒ මත හියුගෝ කියූ ආදර ලජ්ජා බියද පැටවුණු විට කුමාර තවත් දුර්වල වීම පුදුමයට කාරණයක් නොවේ. මෙහිදී කුමාර ගේ සහයට ආවේ පාසල් බස් රථයේ ගමන් කළ ඔහුගේ මිතුරු කොළු රංචුවයි.

ඔවුන් ගේ උපදෙස් සහ සහයෝගය මත කුමාර තම සිතේ සුරේනි ට බැඳුණු ආදරය ලිපියක් පුරා ලියා තම මිතුරන් හා මිතුරු බාලිකා පාසලේ කෙල්ලෙක් අත සුරේනිට ලැබෙන්නට සැලැස්වීය.

කුමාර ගේ සිත අමන්දානන්දයට පත් කරමින් සුරේනි ගෙන් පසුදම පිලිතුරු ලිපියක් ලැබුණි. එහි සඳහන් වුයේ මේ යෝජනාව කෙරෙහි ඇගේ ඇති කැමැත්තයි. නමුත්, නිවසට ආරංචි වේය යන බියෙන් මේ පිළිබඳව නිෂ්ශබ්දව සිටින්නට අවශ්‍ය බවත්, ප්‍රසිද්ධියේ කතාබස් කරන්නට නොහැකි බවත් සුරේනි දන්වා තිබුණි. කෙසේ වෙතත්, ලිපි මගින් තව දුරටත් ඔවුනොවුන් හඳුණාගන්නට ඇය යෝජනා කර තිබුණි.

මාස දෙක තුනක් තිස්සේ මේ ලියුම් ගනු දෙනුව කෙරීගෙන ගියේය. කුමාර සිටියේ සතුටින් ඉහවහ ගිය සිතින් යුතුවය. උසස් පෙල විභාගයට තිබුනේද තව මාස කිහිපයක් පමණි.

සියල්ල එලිදරව් වූයේ ඉන් පසුවයි.

කුමාර ඔහුගේ මිතුරු කොල්ලන් ගේ ද, කෙල්ලන් කීප දෙනෙකුගේ ද ප්‍රායෝගික විහිළුවක නොදැනුවත් කොටස් කරුවෙක් වී සිටියේය. කුමාර ලියූ ලිපි බලා ඒවාට පිලිතුරු ලිපි ලියා තිබුනේ මොවුන් ය. සුරේනි මේ කිසිවක් ගැන හාංකවිසියක්වත් දැන නොසි ටියාය.

සියල්ල අවසන් වූයේ මා මිතුරු කුමාර ඉච්ඡාභංගත්වයට ලක්වී අනාථ වීමෙනි. මා පෙර කී පරිදි ඔහුගේ සිතේ නොමැකෙන කැළලක් ඇතිවන්නට ඇත. ඔහුගේ විභාග ප්‍රතිඵල වූයේ අප හඳුණන පරිදි ලයිට් කණු හතරකි.

සිතේ බිය නිසාම, සිත තුල හැඟුමන් සිර කරගෙන දුක්බර කවි පමණක් ලියමින් සැනසුණු මා පාප මිතුරන් නොලද පිනෙන් මේ ලිපිය ලියන්නට වාසනාව ලද්දෙමි.

සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net

Well experienced teacher at Noble Park
offers tution in
MATHEMATICS AND SINHALESE
to 1-8 level students.

Contact : Shirley
9546 0979 or 0421 903 572

ABN 399 885 48425

SRI WRECK
TOWING



VEHICLE TRANSPORT
BREAKDOWNS
FREE OLD CAR REMOVALS
RELIABLE RATES
TILT TRAY TRUCK
ALL AREAS

24 hours 7 days a week
0433 495 548
udesha@bigpond.com Tel 5995 6105